6

# අධිකරණ ක්ෂේත්‍රය තුළ සමාජ ප්‍රත්‍යෙක වැඩ භාවිතය පිළිබඳව විමසීමක්

***Eranga Panawenna***
*School of social work ,National Institute of Social Development*
*Liyanagemulla, Seeduwa, Srlanka.*
*Tel :+94112882506/07, Email :Info@nisd.ac.lk*

**හැඳින්වීම**

මෙහිදී පළමුව, සමාජ ප්‍රත්‍යෙක වැඩ, එහි ඉතිහාසය, නිර්වචන, අරමුණු හා මූලධර්ම ඇසුරෙන් ලුහුඬින් හඳුන්වා දී, අධිකරණ ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර වශයෙන් සමාජ ප්‍රත්‍යෙක වැඩ භාවිතය පිළිබඳ ව විමසා බැලීම සිදු කරනු ලැබේ. පසුව, ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය තුළ සමාජ ප්‍රත්‍යෙක වැඩ භාවිතය පිළිබඳ ව විවේචනාත්මකව විමසා බලනු ලැබේ. සමාජ ප්‍රත්‍යෙක වැඩ යනු පුද්ගලයා හා පවුල සමඟ වැඩ කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කරනු ලබන වෘත්තීය සමාජ වැඩ පරිචයේදී භාවිතා කරනු ලබන සෘජු නැතහොත් ප්‍රාථමික ක්‍රමවේදවල පළමුවැන්න ලෙස හඳුනා ගත හැකිය (˜Social Case Work - Guide 2 Social Work˜, 2022). මෙහි දී, තනි පුද්ගලයන් හෝ පවුල් වල සමාජ ක්‍රියාකාරිත්වය (Social Functioning) පිළිබඳ ගැටලු වලට අදාළ ව ඒවා විසඳීම සඳහා සිද්ධියෙන් සිද්ධිය වෙන වෙනම සලකා බලන (Case by case approach) යොදා ගනු ලැබේ. 1877 වසරේ දී, ලන්ඩනයේ පුණ්‍යාධාර සංවිධානයේ (Charity Organization of London) ආකෘතිය අනුව පිහිටුවා ගන්නා ලද, ඇමරිකානු පුණ්‍යාධාර සංවිධාන සංගමය (American Charity Organization Society) ඇමරිකා එක්සත් ජනපදය තුළ දිළිඳු පුද්ගලයන්ට උපකාර කිරීම සඳහා ගනු ලැබූ පළමු පියවර වන අතර මෙම සංවිධානයේ අරමුණු වූයේ, දිළින්දන්ට උපකාර කළ හැකි ආකාර සොයා බැලීම හා, ඔවුන්ට උපකාර කළ හැකි තනි පුද්ගල සේවා සංවිධානය කිරීමත් ය. මෙය ප්‍රත්‍යෙක වැඩ පිළිබඳ වෘත්තීය ක්‍රමවේදයේ ආරම්භක අවස්ථාවයි.

මෙම සංවිධානය යටතේ සේවය කළ, "Friendly Visitor" ලෙස හැඳින්වූ ස්වේච්ඡාවෙන් වැඩ කළ පුද්ගලයන් විසින් පළමුව දිළින්දන්ගේ අවශ්‍යතා තක්සේරු කිරීම, ද්‍රව්‍යාත්මක සහය ලබා දීම හා මාර්ගෝපදේශනය, උපදෙස් ලබා දීම යන අරමුණු තෘප්ත කර ගැනීම සඳහා දිළින්දන්ගේ නිවාස වලට ගිය අතර, පසුව "ජ්සා 'ටැබව් / Paid Helper" ලෙස සංවර්ධනය වූ "Friendly Visitors", තම අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රමානුකූල කාර්යපටිපාටියක් අනුගමනය කරන ලදි. එනම්, ඔවුන් දිළින්දන් හා ඔවුන්ගේ පවුල් වල දත්ත එක් රැස් කොට අවශ්‍යතා තක්සේරු කළ පසු උපකාර කරන ලදී. මෙහි දී, සියලුම දත්ත ඇතුළත් පෞද්ගලික තොරතුරු මෙන් ම, සැපයූ උපකාරයේ ස්වභාවය පිළිබඳ ව වාර්තා පවත්වාගෙන යන ලදි.

නිවෙස් වලට ගොස් සේවය ලබා දුන් ප්‍රත්‍යෙකවැඩකරුවන්ට නායකත්වය ලබා දෙන ලද්දේ, ඇමරිකානු ජාතික මේරි රිච්මන්ඩ් (Mary Ellen Richmond) විසින් වන අතර, පළමු සමාජ වැඩ වෘත්තීයවේදිනිය මෙන්ම, සමාජ ප්‍රත්‍යෙක වැඩ නිර්මාතෘවරිය ලෙසද සලකනු ලබන්නේ ඇයයි. එම නිවෙස් වල විසූ පුද්ගලයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් මුහුණ දුන් ගැටළු විසඳීම සඳහා ප්‍රත්‍යෙක වැඩකරුවන් සතු කුසලතාවයන් භාවිතා කරන ලද අතර, ඇය විසින් රචිත, සමාජ රෝග විනිශ්චය (Social Diagnosis) කෘතිය තුළ පළමු වරට, ප්‍රත්‍යෙක සමාජ වැඩ ක්‍රියාවලිය, ගැටළු විසඳීමේ ක්‍රියාවලියක් ලෙස හඳුනා ගන්නා ලදී.

සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රමවේදය භාවිතා කරන ප්‍රත්‍යෙක සමාජ වැඩ වෘත්තිකයන් සේවාලාභියාගේ ගැටලුව සොයා ගැනීම සඳහා මෙන් ම තක්සේරු කිරීම සඳහා ද විධිමත් ක්‍රමානුකූල ප්‍රවේශයක් (Methodical Approach) භාවිතා කරන අතර විවිධ සමාජ වැඩ විද්‍යාඥයන් විසින් විවිධාකාරයෙන් සමාජ ප්‍රත්‍යෙක වැඩ නිර්වචනය කර තිබේ.

මේරි රිච්මන්ඩ්, සමාජ ප්‍රත්‍යෙක වැඩ අර්ථ දක්වන්නේ, විවිධ පුද්ගලයන් සඳහා හා ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ඔවුන්ගේම හා සමාජයේ අභිවෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ දේ කිරීමේ කලාවී ලෙසිනි (Ija, 2022). එමෙන් ම, ඇය විසින් ම සමාජ ප්‍රත්‍යෙක වැඩ, පුද්ගල, එනම්, ගැහැණු, පිරිමි හා ළමයින්ගේ සමාජ සම්බන්ධතා වල වඩා හොඳ ගැළපීමක් ඇති කිරීමේ කලාවී වශයෙන් ද හඳුන්වා දෙයි.

1922 වසරේදී, ඇය, "පුද්ගලයන්, පුද්ගලයා හා සමාජ පරිසරය අතර තනි තනිව හා සවිඥානිකව බලපෑම් සිදු කළ ගළපා ගැනීම් හරහා, පෞරුෂය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිවලින් සමාජ ප්‍රත්‍යෙක වැඩ සමන්විත වන බව" පෙන්වා දී තිබේ. 1920 වසර පමණ වන විට මතු වූ, ෆ්‍රොයිඩියානු මනෝ විද්‍යාව ප්‍රත්‍යෙක වැඩ වර්ධනය සඳහා සුවිශේෂී පිටුවහලක් වූ බව මෙම නිර්වචන තුළින් පැහැදිලි වේ.

ඇමරිකාවේ චිකාගෝ ගුරුකුලය නියෝජනය කරන සමාජ ප්‍රත්‍යෙක වැඩ විෂය පුරෝගාමියෙකු ලෙස සැලකෙන හෙන්රි හැරිස් පර්ල්මන් විසින් සිය 'Social casework A problem solving process' කෘතියෙහි අර්ථ දක්වනු ලබන ආකාරයට, සමාජ ක්‍රියාකාරිත්වයේ දී මතු වන පුද්ගල ගැටලු ඵලදායී ව හසුරුවා ගැනීමට, ඇතැම් මානව සුබසාධන ආයතන විසින් පුද්ගලයන්ට උපකාර කිරීමේ ක්‍රියාවලියී සමාජ ප්‍රත්‍යෙක වැඩ වේ.

ඇමරිකා එකසත් ජනපදයේ හා කැනඩාවේ සමාජ වැඩ විෂය මාලාව සංවර්ධනය සඳහා පුරෝගාමී ව කටයුතු කළ සමාජ වැඩ විෂය පිළිබඳ අධ්‍යාපනඥයෙක් ලෙස සැලකෙන ව(ර්)නර් බොයම් විසින්, පොදුවේ සමාජ වැඩ විෂය හඳුන්වා දෙන්නේ, පුද්ගලයන් හා ඔවුන්ගේ සමාජ පරිසරය අතර පවතින අන්තර් සම්බන්ධතාවය මත පදනම් වූ ක්‍රියාකාරකම් මගින්, කණ්ඩායම් තුල එක් එක් පුද්ගලයන්ගේ සමාජ ක්‍රියාකාරිත්වය පුළුල් කිරීමට කටයුතු කරනු ලබන විෂය (Ni, 2022) ලෙසය.

ඒ යටතේ, බොයම් විසින් පුද්ගලයෙකුගේ ජීවිතයේ මනෝ සමාජීය අංග පිළිබඳ ව කටයුතු කරන සමාජ වැඩ ක්‍රමයක් ලෙස සමාජ ප්‍රත්‍යෙක වැඩ හඳුන්වා දී තිබේ. එනම්, බොයම් ට

අනුව, සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ යනු, පුද්ගලයෙකුගේ භූමිකාවේ කාර්ය සාධනය (role performance) වැඩිදියුණු කිරීම මගින් එම පුද්ගලයාගේ සමාජ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම (Improve), ප්‍රතිෂ්ඨාපනය කිරීම (Restore), නඩත්තු කිරීම (Maintain) හා වැඩිදියුණු කිරීම (Enhance) සඳහා පුද්ගලයෙකුගේ ජීවිතයේ මනෝ-සමාජ අංශවලට මැදිහත් වන සමාජ වැඩ ක්‍රමයකි (Mohinuddin, 2017).

ඇලන් පින්කස් (Allen Pincus) හා ඈන් මිනැහම් (Anne Minaham) ට අනුව, සමාජ වැඩ විෂය තුළ තම ජීවන අරමුණු ඉටු කර ගැනීමට, පීඩාව අවම කර ගැනීමට හා තම අපේක්ෂාවන් හා අගනාකම් අවබෝධ කර ගැනීමට ඇති පුද්ගල හැකියාවට බලපෑම් කරන, පුද්ගලයා හා සමාජ පරිසරය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය පිළිබඳ ව සමාජ වැඩ සැලකිලිමත් වේ (Herath, 2018). ඉහත නිර්වචනවලින් පැහැදිලි වන ආකාරයට, සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ විෂය තුළ පුද්ගලයා, පවුල මෙන් ම පුද්ගල සම්බන්ධතා සම්බන්ධයෙන් ද ඉහළ සැලකිල්ලක් දැක්වීම සිදු වේ.

අවධානමට ලක්විය හැකි, පීඩාවට පත් වූ හා දරිද්‍රතාවයේ ජීවත් වන පුද්ගලයින්ගේ අවශ්‍යතා හා සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මිනිස් යහපැවැත්ම වැඩි දියුණු කිරීම හා සියලු මිනිසුන්ගේ මූලික මානව අවශ්‍යතා සපුරාලීමට උපකාර කිරීම සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ ක්‍රියාවලියේ මුඛ්‍ය අරමුණ වේ.

**සමාජ ප්‍රත්‍යක්ෂ වැඩවල නියුතු වෘත්තිකයාගේ අරමුණු**

සමාජ ප්‍රත්‍යක්ෂවැඩ වෘත්තිකයෙකු විසින් තම සේවාලාභියාට සේවය සැපයීමේ දී, ප්‍රධාන වශයෙන්, සේවාලාභීන් සමග යහපත් සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම, සේවාලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලුව හඳුනා ගෙන, එය හොඳින් අවබෝධ කර ගෙන එම ගැටලුව විසඳා ගැනීම සඳහා සේවාලාභියාට උපකාර කිරීම, සේවාලාභියාගේ මනස ශක්තිමත් කිරීම ,සේවාලාභියාට ඉදිරියේ දී මුහුණ දීමට සිදු විය හැකි ගැටළු වළක්වා ගැනීම, සේවාලාභියා සතු අභ්‍යන්තර සම්පත් වර්ධනය කිරීම මගින් අනාගත අභියෝග වලට සාර්ථක ව මුහුණ දීම සඳහා සේවාලාභියා සූදානම් කිරීම අරමුණු කරයි.

සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ වල ස්වභාවය විමසා බැලීමේ දී, ප්‍රත්‍යක්ෂ සමාජ වැඩ වෘත්තිකයා හා සේවාලාභියා එකිනෙකාගෙන් ස්වාධීන වේ. එනම්, සේවය සපයනු ලබන තැනැත්තා හා සේවාලාභියා අතර සමාන බල සම්බන්ධතාවයක් පවතියි. කිසිවෙකු කිසිවෙකුට ඉහළින් බලය ක්‍රියාත්මක නොකරයි. එමෙන් ම, සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ සම්බන්ධතාවයෙහි ප්‍රතිකාරාත්මක අගයන් (Therapeutic values) ගණනාවක් පැවතිය හැකි ය. සමාජ ප්‍රත්‍යක්ෂ වැඩ ක්‍රියාවලිය පවතින තත්ත්වයේ වර්ධනයක් (improvement of condition) වේ. එමෙන්ම, මෙය පෞරුෂ සංවර්ධන ක්‍රියාවලියක් වන අතර, හැකියාව වර්ධනය කිරීමේ ක්‍රියාවලියකි. මෙහි විශේෂත්වය වන්නේ, සමාජය තුළම වෙනස්කම් සිදු කිරීමේ ක්‍රියාවලියක් වීමය.

ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ සරසවියේ සම්මානිත මහාචාර්යවරියක් වන හෙලන් හැරිස් පර්ල්මන් (Helen Harris Perlman) ද සමාජ වැඩ පිළිබඳ චිකාගෝ ගුරුකුලය නියෝජනය කරන පුරෝගාමී තැනැත්තියක් වන අතර, ඇය විසින් සමාජ ප්‍රත්‍යෙක වැඩ පිළිබඳ ග්‍රන්ථ කිහිපයක් රචනා කොට තිබේ. ඒ අතරින් Social casework A problem solving process (1957) හා Relationship The heart of helping people (1979) යන කෘති සමාජ ප්‍රත්‍යෙක වැඩ පරිචය සඳහා බෙහෙවින් වැදගත් වේ.

විශේෂයෙන්ම, හෙලන් හැරිස් පර්ල්මන්ගේ Social casework A problem solving process (1957) කෘතිය, සමාජ ප්‍රත්‍යෙක වැඩ පිළිබඳ මූලික කරුණු ඇතුළත් කෘතියක් ලෙස සැලකෙන අතර, මෙම කෘතියේ වැදගතකම වන්නේ, සමාජ ප්‍රත්‍යෙක වැඩ විෂයයට අදාළවත්, සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රියාත්මක කිරීමේදීත්, කෙතරම් සංකීර්ණතා ඇතත්, සමාජ ප්‍රත්‍යෙක වැඩ සඳහා ඒකීයත්වයක් මෙන්ම, ඒකාබද්ධතාවයක් ලබා දෙන මූලිකාංග (element), බලවේග (force) හා ක්‍රියාවලි (processes) පවතින බව මෙම කෘතියෙන් පර්ල්මන් පෙන්වා දීම හේතුවෙනි.

ඇය මෙම කෘතිය තුළ එම නියතයන් හඳුනා ගනිමින්, විශ්ලේෂණය කරමින්, ගැටළු විසඳීමේ තාර්කික රාමුව තුළින් එම නියතයන් දකින අතර, "Helen Harrris Perlman’s 5 P’s theory" ලෙස හඳුන්වන ඇය විසින් ඉදිරිපත් කරන ලද සමාජ ප්‍රත්‍යෙක වැඩ වල මූලිකාංග 5 පිළිබඳ ව මෙහි දී හඳුනා ගනු ලැබේ. එනම්, පුද්ගලයා, ගැටලුව, ස්ථානය, වෘත්තීය නියෝජිත, ක්‍රියාවලිය වේ. " person with a problem comes to a place where a professional reperesentative supports him through a given process" යනුවෙන් සමස්ත ක්‍රියාවලිය එහි සියලුම අංග සමග සංක්ෂිප්ත ව දැක්වීමට සමත් වී තිබේ ( (Rengasamy, බ.ා.).

පුද්ගලයා (Person)

සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රියාවලිය තුළ සෑම තැනැත්තෙක්ම පුද්ගලයෙකු ලෙස හඳුනා නොගැනේ. මෙහි පුද්ගලයා ලෙස හඳුනා ගනු ලබන්නේ, පිරිමියෙකු, කාන්තාවක්, ළමයෙකු හෝ සමාජීය, මානසික හෝ ආර්ථික ගැටළු ඇති ඕනෑම සහය අවශ්‍ය හෝ අපේක්ෂා කරන පුද්ගලයෙක් වේ. මේ පුද්ගලයා සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රියාවලිය තුළ සේවාලාභියා ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, තම අපහසුතා කළමනාකරණය කර ගැනීම අපහසු හෝ අසමත් පුද්ගලයෙකු සමාජ ප්‍රත්‍යෙක වැඩ වෘත්තිකයෙකුගේ සහය පතයි.

ප්‍රශ්නය (Problem)

මිනිසාගේ පරිසරයේ ඇති බාධකයක ප්‍රතිඵලයක් ලෙස මතුවන තත්ත්වය ප්‍රශ්නයක් ලෙස හඳුනා ගත හැකිය. හුසේන් හා අලව්දීන් (Hussain & Alauddin) ට අනුව, සමාජ ප්‍රත්‍යෙක වැඩවල ප්‍රශ්නය යනුවෙන් හඳුනා ගනු ලබන්නේ, සේවාදායකයාගේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය අනතුරේ හෙළා හෝ කඩාකප්පල් කර ඇති ආතති සහගත තත්ත්වයක් වේ.

ප්‍රධාන ප්‍රශ්න වර්ග දෙකකි. එනම්, අභ්‍යන්තර පුද්ගල ගැටලු (Intra-personal Problem) හා අන්තර් පුද්ගල ගැටලු (Inter-personal Problem) වශයෙනි. එක පුද්ගලයෙකුට පමණක් බලපාන තත්ත්වයක් හා එම තත්ත්වයේ ප්‍රතිඵලයත් එක පුද්ගලයෙකු පමණක් භුක්ති විඳින අවස්ථාවක එම ගැටලුව අභ්‍යන්තර පුද්ගල ගැටලුවක් ලෙසත්, පුද්ගලයන් 2ක් හෝ වැඩි ගණනකට හෝ කණ්ඩායමකට බලපාන තත්ත්වයක් අන්තර් පුද්ගල ගැටලුවක් ලෙසත් හඳුනා ගනු ලැබේ. පුද්ගලයාගේ ගැටලුවේ ස්වභාවය අනුව ගැටලු වර්ගීකරණය කළ හැකි අතර, උදාහරණයක් වශයෙන්, සමාජීය, මනෝවිද්‍යාත්මක, කායික හෝ මූල්‍යමය ලෙස ගැටලුව වර්ග කළ හැකි ය.

ස්ථානය (Place)

මෙහි ස්ථානය යනු, සේවාලාභියා ප්‍රත්‍යෙක සමාජ වැඩ වෘත්තිකයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන ආයතනයයි. හුසේන් හා අලව්දීන් (Hussain & Alauddin) ට අනුව, ආයතනයක් යනු, සේවාලාභියාගේ දුෂ්කරතාවයට පිළියමක් ලෙස, ද්‍රව්‍යාත්මක හෝ ද්‍රව්‍යාත්මක නොවන, සේවා සපයනු ලබන සංවිධානයයි. ආයතන වර්ග 2 කි. එනම්, රජයේ ආයතන හා පෞද්ගලික ආයතන වේ. සරල ව, රජය විසින් පවත්වා ගෙන යනු ලබන ආයතන රජයේ ආයතන ලෙසත්, රජය සහය දක්වන හෝ ස්වේච්ඡා දායකත්වයෙන් මූල්‍යාධාර සපයා ගන්නා සංවිධාන පෞද්ගලික ආයතන ලෙසත් මෙහි දී හඳුනා ගනු ලැබේ.

වෘත්තීය නියෝජිත (Professional Representative)

මෙහි වෘත්තීය නියෝජිත යනු, සමාජ වැඩ වෘත්තිකයා වන අතර, සේවාලාභීන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීමට හා ඔවුන්ගේ ගැටළු හා විසඳුම් තීරණය කිරීමට සමාජ වැඩ වෘත්තිකයාට හැකි විය යුතුය. හුසේන් හා අලව්දීන් (Hussain & Alauddin) ට අනුව, වෘත්තීය නියෝජිත සමාජ වැඩ පිළිබඳ දැනුම, කුසලතා, අඟනාකම් හා ආචාරධර්ම මත පදනම් ව කටයුතු කළ යුතු අතර, තමා සපයන සේවය පිළිබඳ ව තම සංවිධානයටත්, තම සේවාලාභියාටත් වගකිව යුතුය. සේවා ස්ථානයට සාපේක්ෂව ව ප්‍රත්‍යෙක සමාජ වැඩ වෘත්තිකයාගේ තනතුරු නාමය වෙනස් විය හැකි අතර, එය, පාසල් ප්‍රත්‍යෙක වැඩවෘත්තිකයා හෝ මානසික ප්‍රත්‍යෙක වැඩවෘත්තිකයා හෝ අධිකරණ ප්‍රත්‍යෙක වැඩවෘත්තිකයා විය හැකිය.

ක්‍රියාවලිය (Process)

ක්‍රියා මාලාවක්, ක්‍රියාවලියක් ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රත්‍යෙක සමාජ වැඩ සන්දර්භය තුළ, සේවාදායකයින්ට උපකාර කිරීම හා දුෂ්කරතා විසඳීම සඳහා සිදු කරන ක්‍රියාදාමය ක්‍රියාවලිය ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අදියර 6 ක් හඳුනා ගත හැකි ය.

- ප්‍රවේශය (Intake)

මෙම අවස්ථාවේදී, සේවාලාභියා හා සමාජ ප්‍රත්‍යෙක වැඩ වෘත්තිකයා අතර, පළමු සම්මුඛ සාකච්ඡාව සිදු වන අතර, මෙම අවස්ථාවේදී, සේවාලාභියා සමග සුහදතාවයක් (rapport) ගොඩ නගා ගනියි.

- මනෝ- සමාජීය විශ්ලේෂණය (Psycho Social Study)

මෙම අවස්ථාවේ දී, සේවාලාභියා පිළිබඳ ව මනෝ- සමාජීය කරුණු (Psycho Social Facts) රැස් කර ගැනීම සිදු වේ.

- මනෝ සමාජීය රෝග විනිශ්චය (Psycho Social Diagnosis)

සොයා ගත් මනෝ සමාජීය කරුණු සේවාලාභියාට බලපාන ආකාරය පිළිබද ව විභාග කරමින් තක්සේරු කිරීම මෙම අවස්ථාවේ දී සිදු වේ.

- ප්‍රතිකාර සැලැස්ම / මැදිහත්වීම (Treatment / Intervention)

මෙම අදියරේ දී, සේවාලාභියා සමඟ එක්ව, සේවාලාභියාට අභිමත ආකාරයට සේවාලාභියා විසින් ඉදිරිපත් කළ ගැටලුව විසඳා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගැනීම සිදු වේ.

- ඇගයීම (Monitoroing and Evaluation)

සේවාලාභියාගේ ගැටලුව මෙන් ම, ප්‍රතිකාර සැලැස්මේ ක්‍රියාත්මකභාවය ඇගයීම ට ලක් කිරීම මෙම අවස්ථාවේ දී සිදු වේ.

- අවසන් කිරීම හා පසු විපරම (Follow up and Termination)

සේවාලාභියාගේ තත්ත්වය පිලිබඳ ව පසුවිපරම හා අදාළ කාර්යභාරය අවසන් කිරීම මෙම අදියරේ දී සිදු වේ.

**සමාජ ප්‍රත්‍යෙක වැඩ මූලධර්ම**

සෑම ආයතනයක් සතුවම, එම ආයතනයට අනන්‍ය නීති රෙගුලාසි පද්ධතියක් පවතියි. කෙසේ නමුත්, මෙම සමාජ වැඩ මූලධර්ම එම ආයතනවල අත්‍යාවශ්‍ය ප්‍රමිතීන් වේ. ඒවා මඟින් ප්‍රත්‍යෙක සමාජ වැඩ වෘත්තිකයාගේ ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ සපයයි. ප්‍රධාන වශයෙන් සමාජ ප්‍රත්‍යෙක වැඩ මූලධර්ම 7ක් හඳුනා ගත හැකි ය. එනම්,

1. ප්‍රත්‍යෙකීකරණය
2. අරමුණු සහිත හැඟීම් ප්‍රකාශ කිරීම
3. පාලිත චිත්තවේගීය මැදිහත්වීම
4. පිළිගැනීම
5. නිර්-විනිශ්චිත ආකල්ප

6. සේවාලාභියාට ඇති ස්වයං- නිර්ණය කිරීමේ අයිතිය

7. රහස්‍යභාවය වේ (විජේසේකර, M, 2022).

**අධිකරණ සමාජ වැඩ හැඳින්වීම**

අධිකරණ සමාජ වැඩ ක්ෂේත්‍රය අනෙකුත් සමාජ වැඩ ක්ෂේත්‍ර වලට සාපේක්ෂව, නව ක්ෂේත්‍රයක් වුවද, අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව මෙන් ම, බන්ධනාගාර ගත වන ජනගහනය විශාල වශයෙන් වර්ධනය වීම හේතුවෙන්, සුදුසුකම් සහිත සමාජ වැඩ වෘත්තිකයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි, විශාල ඉල්ලුමක් සහිත සුවිශේෂී ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත හැකි ය.

විශේෂයෙන් ම, සේවාලාභීන් අධෛර්යමත් කරනු ලබන, නිරන්තර වෙනස් වීමට භාජනය වන නීති පද්ධතිය තුළ, අධිකරණ සමාජ වැඩ, අපරාධ යුක්ති ක්‍රමයේ, මනෝවිද්‍යාත්මක හා චර්යාත්මක සේවා සඳහා අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවක් බවට පත් වෙමින් පවතියි.

අධිකරණ සමාජ වැඩ, මානසික රෝහල්වල අපරාධ විත්තිකරුවන් ඇගයීමට හා ප්‍රතිකාර කිරීමට සීමා වී ඇති බව බොහෝ දෙනා සාවද්‍ය ලෙස විශ්වාස කරන නමුත්, විත්තිකරු හෝ පැමිණිලිකරු පදනම් වූ සිවිල් හා අපරාධ යුක්ති ක්‍රම තුළ ක්‍රියාත්මක වන සියලු සමාජ සේවා මෙම ක්ෂේත්‍රයට අදාළ කළ හැකි ය.

ඇමරිකා එක්සත් ජනපදයේ, අධිකරණ සමාජ වැඩ පිළිබඳ ජාතික සංවිධානය (National Organization of Forensic Social Work (NOFSW)) විසින් විස්තර කරනු ලබන ආකාරයට, අධිකරණ සමාජ වැඩ යනුවෙන් හඳුන්වනු ලබන්නේ, නීතිය හා නීති පද්ධති වලට අදාළ ප්‍රශ්න හා විවිධ ගැටලු සඳහා සමාජ වැඩ අදාළ කිරීමයි. සමාජ වැඩ වෘත්තීය යටතේ මෙම ක්ෂේත්‍රය සායන හා මනෝ චිකිත්සක රෝහල් වලින් ඔබ්බට ගොස් අපරාධ විත්තිකරුවන්ගේ ගැටලු වල නීත්‍යානුකූල බව හා වගකීම ඇගයීම හා ඒවාට විසඳුම් ලබා දීම දක්වා දිව යයි.

අධිකරණ සමාජ වැඩ පිළිබඳ ව පුළුල් ව සිදු කරනු ලබන නිර්වචනයකට, අපරාධ සහ සිවිල් යන දෙඅංශයෙන් ම නීතිමය ගැටළු සහ නඩු පැවරීම් වලට සම්බන්ධ වන සමාජ වැඩ පරිචයන් ඇතුළත් වේ. ඒ අනුව, ළමා භාරකාරත්වය සම්බන්ධ ගැටළු, නීත්‍යානුකූල වෙන් වීම, දික්කසාදය, නො සලකා හැරීම, දෙමාපියන්ගේ අයිතිවාසිකම් අවසන් කිරීම, දරුවන් හා කලත්‍රයා අපයෝජනය කිරීම, බාල වයස්කාර සහ වැඩිහිටි අධිකරණ සේවා, විශෝධනය හා සිවිල් ආරවුල් යන සියල්ල මෙම නිර්වචනය ට අයත් වේ (˜Forensic Social Work, 2020).

බාකර් හා බ්‍රැන්සන් (Barker and Branson) (2000) අධිකරණ සමාජ වැඩ පුළුල් නීතිමය පරිසරයක් තුළ තැබූ අතර, ඔවුන් එය සමාජයේ නීතිමය සහ මානව සේවා පද්ධතිය අතර අතුරු මුහුණත (interface) කෙරෙහි අවධානය යොමු කරන වෘත්තීය විශේෂත්වයක් ලෙස අර්ථ දැක්වීය. Hughes and Neal (1983) අධිකරණ සමාජ වැඩ නීතිය හා මානසික සෞඛ්‍යය යන ක්ෂේත්‍ර දෙකෙහි අන්තර්ජේදනයක් ලෙස හඳුනා ගන්න අතර, අධිකරණ සමාජ වැඩ

වෘත්තිකයන් සේවය කරන්නේ, නීතිය හා මානසික සෞඛ්‍යය යන අංශ දෙක ම සමස්තයක් (Gestalt) ලෙස සලකා එම අංශ දෙකම අතිඡාදනය වන විට ය.

Roberts and Brownell (1999) අනුව, අධිකරණ සමාජ වැඩ යනු, විශේෂයෙන් වින්දිතයින් හා ළමා හෝ වැඩිහිටි වැරදිකරුවන් වැනි විශේෂිත ජනගහනයකට සේවය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අවශ්‍ය වෘත්තියක් වන අතර, ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම මෙන් ම, ඔවුන් සමග කටයුතු කරමින් සමාජ වැඩ වෘත්තීය භූමිකාව ක්‍රියාත්මක කිරීම, අධිකරණ සමාජ වැඩ වෘත්තිකයන් විසින් සිදු කරනු ලැබේ.

**අධිකරණ සමාජ වැඩ වෘත්තිකයකුගේ කාර්යභාරය**

අධිකරණ සමාජ වැඩ වෘත්තිකයන් විසින්, ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය, මැදිහත් වීම, උපදේශනය සහ බේරුම්කරණය, ඉගැන්වීම, පුහුණුව හා අධීක්ෂණය, චර්යාත්මක විද්‍යා පර්යේෂණ හා විශ්ලේෂණය යන කාර්යයන් වලට අමතරව, අපරාධ යුක්තිය, බාලවයස්කාර යුක්තිය හා විශෝධන ක්‍රමවේද පිළිබඳ ව, නීති සම්පාදකයින්, නීතිය ක්‍රියාත්මක කරන්නන්, නීතිඥයින්, නීති සිසුන් සහ නීතිවේදීන් මෙන් ම, මහජන සාමාජිකයන් ට, උපදේශනය, අධ්‍යාපනය හෝ පුහුණුව ලබා දීම සිදු කරයි (˜Forensic Social Work˜, 2020).

ඊට අමතර ව, අපරාධ හා බාලක යුක්තිය (criminal and juvenile justice) සම්බන්ධ ක්‍රියාවලියට මැදිහත් වූ පුද්ගලයන් සම්බන්ධ, රෝග විනිශ්චය, තක්සේරු කිරීම හා ප්‍රතිකාර කිරීමත් (Diagnosing, assessing, and treating), මානසික තත්ත්වය, දරුවන්ගේ අවශ්‍යතා, නොහැකියාවන් හෝ සාක්ෂි දීමට ඇති නොහැකියාව පිළිබඳව රෝග විනිශ්චය කිරීම, ප්‍රතිකාර කිරීම හෝ නිර්දේශ කිරීම, විශේෂඥ සාක්ෂිකරුවෙකු ලෙස සේවය කිරීම, නීතිය බලාත්මක කරන්නන් සහ අනෙකුත් අපරාධ යුක්තිය පසිඳලීමේ නිලධාරීන් පරීක්ෂා කිරීම, ඇගයීම හෝ ප්‍රතිකාර කිරීම (Screening, evaluating, or treating) ආදිය අධිකරණ සමාජ වැඩ වෘත්තිකයෙකු ලෙස ඉටු කරනු ලැබේ (˜Forensic Social Work, 2020).

අධිකරණ සමාජ වැඩ වෘත්තිකයෙකු බවට පත් වීම සඳහා අපරාධ යුක්ති ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය වැදගත් වන අතර, ඕනෑම සමාජ වැඩ වෘත්තිකයෙකුට පහසුවෙන් කටයුතු කළ නොහැකි සුවිශේෂී පුහුණුවක්, පළපුරුද්දක් හා දැනුමක් සහිත ව ප්‍රවේශ විය යුතු විෂය ක්ෂේත්‍රයක් ලෙස අධිකරණ සමාජ වැඩ ක්ෂේත්‍රය හඳුනා ගත හැකි ය.

ශ්‍රී ලංකාවේ අධිකරණ යුක්ති ක්‍රමයට, පොලිසිය, අධිකරණය හා බන්ධනාගාරය යන ආයතන ත්‍රිත්වය ම සම්බන්ධ වන අතර, අධිකරණ සමාජ වැඩ වෘත්තිකයන් ලෙස අපරාධ යුක්ති ක්‍රමය හා සම්බන්ධව කටයුතු කරන වෘත්තිකයන් දැනට නොමැත. කෙසේ නමුත්, මෙම ක්ෂේත්‍ර වල වෙනත් තනතුරු වල සේවය කරන නිලධාරීන් ට සමාජ වැඩ විෂය සම්බන්ධයෙන් දැනුම ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් පවතියි.

**නිගමනය**

ජාත්‍යන්තර අත්දැකීම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, ශ්‍රී ලංකාවේ අධිකරණ යුක්ති ක්‍රියාදාමය තුළ ඉහත විස්තර කළ ආකාරයට, සමාජ ප්‍රත්‍යෙක වැඩ, වැළැක්වීම (Prevention), ප්‍රවර්ධනය (Promotion), සුව කිරීම/ පිළියම් (Cure/Remedy), පුනරුත්ථාපනය (Rehabilitation), ප්‍රතිෂ්ඨාපනය (Restoration) හා  සමාජ පරිසරය වෙනස් කිරීම සඳහා භාවිතා කළ හැකි ය. ඒ අනුව, සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රමවේදය හරහා, සේවාලාභියා හා ඔහුගේ පවුලේ අය සමඟ කටයුතු කිරීමට උත්සාහ කිරීම තුළින් සේවාලාභියාගේ සමාජ ක්‍රියාකාරීත්වයේ තිරසාර ප්‍රශස්ත මට්ටමක් පවත්වා ගැනීමට සමාජ වැඩ වෘත්තිකයන් ට හැකි වේ (Boehm, 1967). එය අධිකරණ සමාජ වැඩ ක්ෂේත්‍රයට ද එක ලෙස අදාළ ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Boehm, W. W. (1967). Social Psychiatry and Social Work. Canadian Psychiatric Association Journal, 12(1_suppl), 29–39. https://doi.org/10.1177/070674376701201S06

Forensic Social Work. (2020). Retrieved 30 August 2022, from https://www.nofsw.org/what-is-forensic-social-work-1

Herath, H.MC.J. (2018). Social welfare and social work. Lecture 4, University of Sri Jayewardhanapura

Ijaz, M. (2022). Definition of social case work. Retrieved 27 August 2022, from https://socialwork.pk/definition-of-social-case-work/

Kumar, R. *Social Work Methods* [Ebook]. Retrieved from https://ddceutkal.ac.in/Syllabus/MSW/Paper-5.pdf

Mohinuddin, M. (2017). What is Social Casework?. Retrieved 27 August 2022, from https://www.sweducarebd.com/2017/03/social-casework-method.html

Ni, S., 2022. Social Work's Focus of Concern. [Blog] *Social Work and Beyond*, Available at: <http://ocialangakingwork.blogspot.com/2010/02/social-works-focus-of-concern.html> [Accessed 26 September 2022].

Rengasamy, S. *Social Case Work* [Ebook]. Retrieved from http://daga.co.in/pages/msw/PG-MSW-I%20YEAR-MAJOR-(CW)Social%20Work%20Practice%20With%20Individual.pdf

Sharma, V., n.d. *Working with Individual*.

Social Care Institute for Excellence (SCIE). 2022. *Prevention in social care*. [online] Available at: <https://www.scie.org.uk/prevention/social-care> [Accessed 26 September 2022].

Social Case Work – Guide 2 Social Work. (2022). Retrieved 22 May 2022, from https://guide2socialwork.com/social-case-work/

Wijesekara ,M. (2021). Methods and Techniques in Social Case Work 1. Lecture 6, National Institute of Social Work